(1)

දැන්වීමයි

කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2 සේවා ගණයේ සෞඛ්‍ය උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත බඳවා ගැනීම - 2026

කොළඹ මහා නගර සභාවේ **සෞඛ්‍ය උපදේශක III** ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම්ලත් **අභ්‍යන්තර අයදුම්කරුවන්** වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික සේවා ගණයේ සේවකයින් සඳහා ඉල්ලුම් කල හැකිය. මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට මේ සමඟ දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව, අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සමඟ **2026.07.28** දිනට පෙර නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02. තනතුරු නාමය: බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ සෞඛ්‍ය උපදේශක III ශ්‍රේණිය

I. වැටුප් කේත අංකය : **MN 1-2025 (10/2025 අනුව)**

II. මාසික වැටුප් පරිමාණය :- **45230-10X540-11X630-10X890-10X1190-78360**

III. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් යෝජනය.

IV. තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම්:
භාෂාව සහ ගණිතය ඇතුළුව අ.පොස.ස (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සමමාන 02 ක් සහිතව විෂයන් 06 කින් සමත්වී තිබීම.

V. වෘත්තීය සුදුසුකම්: අදාළ නොවේ.

VI. පළපුරුද්ද : පුරප්පාඩුව පවතින පළාත් පාලන ආයතනයේ යටත් පිරිසෙයින් අයදුම්පත් කැඳවන අනුයාන දිනට පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති ප්‍රාථමික සේවා ගණයේ යම් පත්වීමක් දරන පත්වීම ස්ථිර කරනු ලබන නිලධාරීන් විය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

VII. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

VIII. වෙනත් : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IX. වයස් සීමාව : අදාළ නොවේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය:- නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයකින් සමත්ව තිබීම හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය තුළින් සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් තෝරා පත් කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය හුදෙක් සුදුසුකම් පරීක්ෂා කිරීම හා යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්වයක් ඇතිබව තහවුරු කර ගැනීම සඳහා පමණි.)

CamScanner

04. ලිඛිත විභාගය:-

I. විභාග ශාස්තු :- 2025.01.28 දිනැති මූල්‍ය කළමනාකරණ කමිටුවේ තීරණ අංක 1137 අනුව මෙම විභාගය සඳහා පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ට විභාග ශාස්තු අය නොකෙරේ. එනකුදු වුවත් ඉන්පසු අවස්ථාවේ පෙනී සිටින අයදුම්කරුවන් සම්පූර්ණ විභාගය සඳහා රු. 500/= ක් ගෙවිය යුතුවේ.

II. විභාග ශාස්තු :- එය කොළඹ මහා නගර සභාවේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ පරිපාලන ආදායම ශීර්ෂ 7112015025 ට බැර වන පරිදි කොළඹ මහා නගර සභාවේ සරප අංශය වෙත ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.

III. එම ගෙවීමට අදාළ ලදුපත අයදුම්පතට අලවා එවිය යුතුය.

විෂයන්	කාලය	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
සාමාන්‍ය දැනුම	පැය 01	100	40%
බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%

05. විෂය නිර්දේශය-

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
සාමාන්‍ය දැනීම	ජාතික කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාල සාධකයන් සම්බන්ධව ඇගයීම
බුද්ධි පරීක්ෂණය	තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, ක්ෂණික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීම

06. බඳවා ගන්නා සංඛ්‍යාව 30 ක් පමණි.

07. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය. 2026.07.28 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් වල අත්හැරීම් හා ප්‍රමාද දෝෂයන් පිළිබඳ වගකීම් ඒ ඒ දෙපාර්තමේන්තුව වෙත පැවරේ.

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

ඒ.ඩී.එස්.රෝහණ,
නාගරික කොමසාරිස් (රා.ඉ),
කොළඹ මහා නගර සභාව.

2026. ජූලි මස 21 වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.

CamScanner